**රුහුණු විශ්වවිද්‍යාලයය**

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - 2020/2021 අධ්‍යයන වර්ෂය

දෙවන සමාසික අවසාන පරීක්ෂණය 2022 ජූනි

## MAE 5203- ලෝක ආර්ථික ප්‍රවණතා

කාලය පැය 3:00 යි

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය.

එක් කොටසකින් ප්‍රශ්න දෙක (2) බැගින් තෝරා ගෙන ප්‍රශ්න හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න

### අ කොටස

1.

i. නිදහස් වෙළෙඳාම, විවෘත ආර්ථිකය, ආර්ථික ලිබරලීකරණය, සහ ගෝලීයකරණය (Free trade. Open economy. Economic liberalization and Globalization) යන සංකල්පයන් අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. ආර්ථික ගෝලීයකරණයේ ගාමක බලවේග (Driving forces) සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

iii. "ආර්ථික ගෝලීයකරණය ඇත්ත වශයෙන් ම උතුර හා දකුණ රටවල් අතර පරතරය අඩු කරනවාට වඩා පුළුල් කිරීමකට හේතු වී ඇත". සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

2.

i. ජාත්‍යන්තර ද්‍රවශීලතා ප්‍රශ්නය (International liquidity problem) විසඳීම අරභයා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඓතිහාසිකව ගනු ලැබ ඇති විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග ලේඛනගත කරන්න.

(ලකුණු 04)

ii. තම සාමාජික රටවලට අමතර ණය සැපයීමේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පනවනු ලබන ණය කොන්දේසි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

iii. ප්‍රකාශිත එම ණය කොන්දේසි ශ්‍රී ලංකාව වැනි ආර්ථික අර්බුදයක් අත්විඳින කුඩා විවෘත ආර්ථිකයකට යෙදීමට ඇති හැකියාව සහ සීමාකම් සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

3. පහත මාතෘකා අතරින් **ඕනෑම දෙකක් (2)** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. උතුරු දකුණු සංවාදය සහ කේන්ද්‍රීය-පරිවාර සංකල්පය.

ii. ලෝක වෙළෙඳ සංවිධානය සහ බාලි පැකේජය (WTO & Bali package).

iii. ජාත්‍යන්තර ත්‍රස්තවාදය සහ යුක්රේන්-රුසියානු යුද්ධය (international terrorism & Ukraine-Russian War).

iv. චීනයේ එකම තීරයක් එකම මාවතක් ව්‍යාපෘතිය (One belt and one Road initiative of China).

(එක් කොටසකට ලකුණු 08 බැගින් මුළු ලකුණු 15 යි)

## ආ කොටස

4.

i. COVID-19 වසංගතය විසින් ලෝකය පෙර නොවූ විරූ පරිමාණයේ සමාජ-ආර්ථික හා මූල්‍ය අර්බුදයකට ඇද දමා ඇත. සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ii. COVID-19 වසංගතය විසින් "අයිතිවාසිකම් මත පදනම් වූ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයක්" (A rights-based participatory development approach) ක්‍රියාත්මක කිරීම සඳහා ලෝකයට බලකරනු ලැබ ඇත. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? හේතු දක්වන්න.

(ලකුණු 07)

5.

i. "පසුගිය දශක පහ පමණ කාලය තුළ ගෝලීය ආර්ථිකය තුල ණය සමුච්චයේ රැළි පහක් හඳුනාගත හැකිය". මෙම ණය සමුච්චයේ රැළි මොනවාද යන්න දක්වා සහ ඒ සඳහා බලපාන ලද සාධක කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

ii. ශ්‍රී ලංකාවේ ණය අර්බුදය සඳහා බලපාන ලද මූලික හේතු මොනවාද යන්න දක්වා මෙම අර්බුදයෙන් මිදීම සඳහා ගතහැකි කෙටිකාලීන සහ මධ්‍ය කාලීන ප්‍රතිපත්තිමය උපායමාර්ග මොනවාද යන්න කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

6. පහත මාතෘකා අතරින් **ඕනෑම තුනක් (03)** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ගෝලීයකරණයේ වාසි සහ අවාසි.

ii. නිල සංවර්ධන ආධාරයන්හි සුවිශේෂී ගුණාංග.

iii. රාජ්‍ය හතේ කණ්ඩායම (G7).

iv. අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය (ASIAN).

(එක් මාතෘකාවකට ලකුණු 5 බැගින් මුළු ලකුණු 15)

@@@@@@@